# චූටි කූකූ



ඩී.ජ්.ශෙනුකි හසන්‍යා නිම්සදු අලුත්වත්ත

# කෘතියේ නම - චූටි කුකු

කතෘ - D.A ශෙනුකි හසනායා
නිම්සදු අලුත්වත්ත

## ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල

## 3 B

ISBn 978 62421 11 48-3

කෘතිය පලකරන දිනය 2026 05 10

# පිදුම

මාගේ ආදරණීය
අම්මාටත්,අප්පච්චිටත්
පාසලේ ආදරණීය
විදුහල්පති ඇතුළු
ගුරු මෑණිවරුන්ටත්,
ගුරු පියවරුන්ටත්,
මගේම ආදරණීය සහෝදර
සහෝදරියන්ටත්
මෙම කතා පොත
ආදරයෙන් ගෞරවයෙන්
පුද කර සිටිමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# පෙරවදන

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර සහ අප පාසල් පුස්තකාල සභාව එක්ව සංවිධානය කළ මෙම ඊ-පොත් ව්‍යාපෘතිය වෙනුවෙන් මාගේ සුබාශිංසන පිරිනැමීමට මම ඉතා සතුටු වෙමි.
මෙම ව්‍යාපෘතිය අපගේ ශිෂ්‍යාවන්ගේ නිර්මාණශීලීත්වය, විචාරශීලී චින්තනය සහ උද්‍යෝගය මනාව පෙන්වා දෙයි. තරුණ සිසුන් කියවීම, ලිවීම සහ දැනුම බෙදාගැනීම සඳහා නවීන ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීම දැකීම ඉතා සතුටට කරුණකි.
මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා කැපවූ පුස්තකාලාධිපතිතුමියට, පුස්තකාල සභාවේ සාමාජිකයන්ට, ගුරුභවතුන්ට සහ ශිෂ්‍යාවන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.
මෙම වැඩසටහන ඉගෙනීමට සහ නව දැනුම සෙවීමට තවත් උනන්දුවක් ඇති කරනු ඇතැයි මා විශ්වාස කරමි.
අපගේ ගුරුභවතුන්ට සහ ශිෂ්‍යාවන්ට අඛණ්ඩ මගපෙන්වීම ලබාදුන් ශ්‍රීමාන් සෙනෙවිරත්න මහලේකම් මහතාට විශේෂ ස්තුතිය පුද කරමි.
ඔබ සැමට සෑම සාර්ථකත්වයක්ම ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය ලලිත් නවරත්න
විදුහල්පති
ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති  හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන්  සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගීත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


ඔන්න එක දවසක් අප්පච්චියි මමයි ගමනක් යනකොට පාර අයිනෙ බලු පැටව් දෙන්නෙක් හිටියා .




ඉතින් මම අප්පච්චිට කියලා ඒ චූටි බලු පැටව් දෙන්නව ගෙදර එක්කන් ආවා.




ගෙදර එක්කන් ඇවිත් නාවලා කිරි එකකුත් හදලා දුන්නා.




මම එයාලට කුකූ,කිකී
කියලා නම් දෙකකුත් දැම්මා.



අපි තුන්දෙනා සෙල්ලම් කරලා සතුටින් හිටියා.



දවසක් මම ඉස්කෝලෙ ගිහින්
එනකොට
කිකී පාරට දුවගෙන ගිහින්
වේගෙන් ආපු කාර් එක්ක එයා හැප්පිලා.



මට ගොඩක් දුකයි 😓


කිකී මැරුණා.කුකූ කිකී ළඟටම වෙලා හිටියා.
මමත් ගොඩක් ඇඬුවා.



අප්පච්චියි මමයි එකතුවෙලා වලක් කපලා කිකීව වැලලුවා. එයාට අපි පිං දුන්නා.




දැන් ඉතින් කුකුයි මායි
හොඳ යාළුවෝ.
හැමදාම අපි සෙල්ලම් කරනවා.




කුකූ මම යන හැමතැනකටම එනවා  මම කන බොන හැමදේම කුකූටත් මම දෙනවා.



කුකු මට ගොඩක් ආදරෙයි. මමත් කුකුට ගොඩක් ආදරෙයි.



කුකූ මාව ආරක්ශා කරනවා. කාටවත් මාව අල්ලන්නවත් දෙන්නෙ නෑ.
මම කුකූව ආදරෙන් හැමදාම බලාගන්නවා.



# ස්තූතිය

මේ පොත සෑදීමට නන් අයුරින් සහය දුන් සැමට මාගේ ස්තූතිය !



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)